# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.30 පැය 0600 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1905/2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. විදුලි සැර වැදී පුද්ගලයන් තිදෙනෙකු මියයාම - නොරච්චෝලය පොලිස් වසම.**

2024.12.29 වන දින සවස් කාලයේ නොරච්චෝලය පොලිස් වසමේ මාම්පුරිය ප්‍රදේශයේදී, විදුලි සැර වැදීමක් හේතුවෙන් පුද්ගලයන් සිවු දෙනෙකු පුත්තලම රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව පුද්ගලයන් තිදෙනෙකු මියගොස් ඇති බවට නොරච්චෝලය පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුවන් අවුරුදු 16, 22 හා 29 වයස්වල පසුවන පුත්තලම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මාම්පුරිය ප්‍රදේශයේ පිහිටි අලුතින් ඉදි කරමින් පවතින උත්සව ශාලා ගොඩනැගිල්ලක සේවකයන් පිරිසක් යකඩ පලංචියක් මත ඉදිකිරීම් කටයුතු කරමින් සිටියදී විදුලිය ලබා ගන්නා ලද විදුලි රැහැනකින් යකඩ පලංචියට විදුලිය කාන්දුවීමෙන් මෙම විදුලි සැර වැදී ඇති බවට පොලිසිය සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. නොරච්චෝලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. කොකේන් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල ඒකකය.**

2024.12.29 වන දින අළුයම් කාලයේ ගුවන් තොටුපල රේගු මත්ද්‍රව්‍ය පාලන ඒකකයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **කොකේන් මත්ද්‍රව්‍ය කිලෝ 04 ග්‍රෑම් 68** ක් විදේශ රටක සිට රැගෙන පැමිණි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 41 ක් වන දකුණු අප්‍රිකානු ජාතික කාන්තාවකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03.** **මත්පෙති සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - මාවනැල්ල පොලිස් ස්ථානය.**

2024.12.29 වන දින සවස් කාලයේ මාවනැල්ල පොලිස් වසමේ හීන්දෙනිය සුසාන භූමිය අසලදී මාවනැල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මත්පෙති 8100 ක්, සැකකරුවන් පැමිණි වෑන් රථයක් සහ යතුරු පැදියක්** සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22, 24 හා 25 වයස්වල පසුවන මාවනැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

එක් සැකකරුවෙකු වෑන් රථයකින් මත්පෙති කොළඹ සිට රැගෙන පැමිණ ඉහත ප්‍රදේශයේදී යතුරු පැදියකින් පැමිණි සැකකරුවන් දෙදෙනෙකුට අලෙවි කරමින් සිටියදී මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත. මාවනැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.12.29 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ගල්කිස්ස දුම්රිය ස්ථානය අසලදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන මිල්ලනිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05.** **හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.12.29 වන දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ෆර්ගියුෂන් පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 04 මිලිග්‍රෑම් 470 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බේරුවල පොලිස් ස්ථානය.**

2024.12.29 වන දින සවස් කාලයේ බේරුවල පොලිස් වසමේ වලතර ප්‍රදේශයේදී බේරුවල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන බේරුවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බේරුවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගිරිබාව පොලිස් ස්ථානය.**

2024.12.29 වන දින සවස් කාලයේ ගිරිබාව පොලිස් වසමේ වල්පාලුව ප්‍රදේශයේදී ගිරිබාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන ගල්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගිරිබාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - බගවන්තලාව පොලිස් ස්ථානය.**

2023.12.29 වන දින අළුයම් කාලයේ බගවන්තලාව පොලිස් වසමේ කොටියාගල වත්ත ප්‍රදේශයේදී බගවන්තලාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන බගවන්තලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බගවන්තලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**